# අලුත් අවුරුදු උදානය

අප ශ්‍රී ලංකාවට උරුම වූ අලුත් අවුරුදු උත්සවය යෙදෙන්නේ අප්‍රේල් (බක්) මසටයි. සිංහලයන්ගෙන් බහුතරයක් වන බෞද්ධයන් හා දමිළයන්ගෙන් බහුතරයක් වන හින්දු භක්තිකයනුත් අලුත් අවුරුදු චාරිත්‍රවල යෙදෙනු අපට දැක ගත හැකිය. කොවුල් ගී නද කැවුම් කොකිස් සුවඳ හා රස කැවිලි සුවඳ අපට අවුරුදු සිරිය ගෙනදේ.

අලුත් අවුරුද්ද උදාව සිදුවන්නේ සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට සංක්‍රමණය වීමත් සමගයි. අවුරුදු උදාවට පෙර කාලය නොනගතය හෙවත් පුණ්‍ය කාලය ලෙස හඳුන්වයි. නොනගතය යනු නැකත් නොමැති කාලයයි. මේ කාලය තුල කා බී ලිප ගිනි නිවා දමා සියලුම වැඩ අත්හැර ආගමික කටයුතුවල යෙදීම සිදුවෙයි. අවුරුදු චාරිත්‍ර සියල්ලම සිදුවන්නේ නැකත් වේලාවන් මුල් කරගෙනයි. නැකතට ලිප ගිනි මෙලවීම, ආහාර පිසීම, ආහාර අනුභවය, හිස තෙල් ගෑම, රැකී රක්ෂා සඳහා පිටත් ව යාම ඉතා වැදගත් චාරිත්‍ර වෙයි.

ලක්වැසි ජනතාව දුප්පත්, පොහොසත්, උගත්, නූගත් බේදයකින් තොරව එකම වේලාවක චාරිත්‍ර, චාරිත්‍ර ඉටු කරන ලබන මංගල උත්සවය මෙය වෙයි. මේ මංගල උත්සවය සැමරීම සඳහා ශ්‍රී ලංකා වාසී බෞද්ධ හා හින්දු ජනතාව සති ගණනාවක සිට ලක් ලෑස්ති වෙනු ලබයි. ගෙවල්, දොරවල් පිරිසිදු කිරීම, අලුත් ඇඳුම් මැසීම, කිරිබත් ඉවීම සඳහා අලුතෙන් වලං මුට්ටි ගැනීම, කැවිලි පෙවිලි සෑදීම වැනි කටයුතු ඉන් සමහරකි. කුඩා දරුවන් අවුරුදු උදාව වෙන තෙක් නොඉවසිල්ලෙන් බලා සිටින්නේ අලුත් ඇඳුම් ඇඳගෙන නෑ ගම් යාමටයි.

අවුරුදු උදාවත් සමග බාලයන් වැඩිහිටියන-''ට බුලත් හුරුල්ලක් දී වැඳීම, තෑගි බෝග හුවමාරුව, වැඩ ඇල්ලීම, ගනු දෙනු කිරීම, ආහාර අනුභවය වැනි චාරිත්‍ර ඉටු වෙයි.

හිස තෙල් ගා ස්නානය කිරීමේ අවුරුදු චාරිත්‍රය දී පන්සලේ හෝ වෙද ගෙදර විශේෂයෙන් සාදනු ලබන තෙල් හා නානු වැඩිහිටියකු විසින් නිදුක් නිරෝගී බව ලැබේවායි ප්‍රාර්ථනා කර බාල මහලු සැමගේ හිස ගා ආශිර්වාද කරනු ලබයි. සිංහල අවුරුදු චාරිත්‍රවල අවසාන චාරිත්‍රය රැකී රක්ෂා සඳහා සුභ මොහොතින් පිටත්ව යාමයි.

කොවුල් ගි නද මැද රතිඤ්ඤා හා රබන් හඬ මුසු මෙම කාලයේදී මුළු ගමම උත්සව සිරියක් ගනිද්දී, ගැහැණු පිරිමි භේදයකින් තොරව ජන ක්‍රීඩා වල නිරත වීම සිදු වෙයි. පංචා දැමීම, ඔලිඳ කෙලිය, ඔන්චිලි පැදීම වැනි ජන ක්‍රීඩා එයින් සමහරකි. විවිධ විනෝදාත්මක ක්‍රීඩා වර්තමානයේදී තරඟ වලට එකතු වී තිබේ. අවුරුදු උත්සවයේ තවත් ප්‍රධාන අරමුණක් වන්නේ අවට ගම්වැසියන් සියලුම දෙනා යොදා ගත් දිනකදී ගම් පිට්ටනියට එකතු වී ක්‍රීඩා කරමින් විනෝද වීමයි. ලක්බිමින් ඈත සිටියත් මෙම සිරිත් විරිත් අපට අමතක වී නොමැති බව පසක් කරන්නේ ඉතා ආඩම්බ-රයෙනි.

ශ්‍රී ලංකා ජර්මාන් කාර්මික අභ්‍යාස ආයතනිය ආදි ශිෂ්‍ය සංගමය මගින් වාර්ෂිකව පවත්වන ලබන බක් මහා උළෙල 21වන වතාවට මෙවරත් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට තවත් ඇත්තේ ඉතා සීමිත කාල සීමාවකි. ඔබ අප සියළු දෙනාටම ලංකාවේ අවුරුදු අසිරිය සිහි ගන්වමින් මනසින් අප මව්බිම වෙත කැඳවාගෙන යමින් මෙල්බන් පුරවරයේදී පවත්වන දැවැන්තම බක් මහා සැණකෙළිය වූ මෙම උත්සවයේ සංවිධානය පිටුපස ඇත්තේ ආදී ශිෂ්‍ය සංගමයේ සියළුම සාමාජිකයන්ගේ එකමුතු බවේ දැවැන්ත හස්තයයි.

ආදී ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන්ගේ පවුල් වල සහභාගීත්වයෙන් සූදානම් කරනු ලබන අවුරුදු තේ මේසය පැමිණෙන සියළු දෙනා සඳහා විවෘත වූවකි. අවුරුදු චාරිත්‍ර වල වැඩිහිටියන්ට සැලකීමේ උතුම් ගුණාංගය සිහි ගන්වමින් වයෝවෘද්ධ දෙමාපියන් වෙත කුඩා දරුවන් විසින් කැවිලි පෙවිලි වලින් සංග්‍රහ කරමින් සිදු කරන ලබන වැඩිහිටි උපහාරය මෙවරද පැවැත්වී කටයුතු සූදානම් කර තිබේ.

අවුරුදු පහෙන් පහල කුඩා සිගිත්තගේ සිට අවුරුදු පනහෙන් ඉහල මැදිවිය දක්වා සියලුම වයස්වල ගැහැණු පිරිමි සැමට තරඟ වලට සහභාගී වී හෝ නරඹමින් ආස්වාදයක් ලැබිය හැකි ජනප්‍රිය අංග ඇතුලත් වන ලෙස තරඟ සංවිධානය කර තිබෙන අතර තරඟ ඉසව් වල ජයග්‍රාහක, ජයග්‍රාහිකාවන් සඳහා වටිනා ත්‍යාග පිරිනැමීමද සිදු කෙරෙයි.

ඉතා පුළුල් වයස් පරාසයක් පුරා දිවෙන තරඟ අතර විශේෂයෙන් අප කුඩා දරුවන් සඳහා හාවුන් පැනීම, බනිස් කෑම, අලියට ඇස තැබීම, බැලුන් පිපිරවීම, ගෝනි රේස්, තුන්පා දිවීම වැනි තරඟත් වැඩිහිටියන් සඳහා හැන්ද මත දෙහි ගෙඩිය තබාගෙන දිවීම, කඹ ඇදීම, අත්ලෙන් වතුර පිරවීම, ජන ගී ගායනය, සැඟවුන අමුත්තා සෙවීම, පැපොල් ගෙඩියේ ඇට ගණන් කිරීම, ලිස්සන ගසේ නැගීම, කොට්ටා පොර ගැසීම වැනි ක්‍රීයා ඇතුලත් මෙම උත්සවයේ ක්‍රීඩා අංගයන් විවිධත්වයකින් යුතුව පැවැත්වීමට සංවිධායක මඩුල්ල තීරණය කර තිබේ.

සූර්යයා මීන රාශියේ සිට මේශ රාශිය කරා ගමන් කිරීම මුල් කරගෙන සිදු කරන ලබන මෙම සූර්යය මංගල්‍යයට ආවේණික වූ සිරිත් විරිත් හෙළ කෙලි සෙල්ලම් පරපුරෙන් පරපුරට ගෙන යන ගමනට මෙම අවුරුදු උත්සවයෙන් කෙරෙනුයේ අනුපමේය සේවයකි. මෙම සිරිත් හා චාරිත්‍ර අප දරුවන්ට පෙන්වා දී ඔවුනට අවුරුදු සිරියේ අවබෝධය ලබා දීම වැඩිහිටි අපගේ උත්සාහය හා චේතනාවයි.

මෙම අවුරුදු උත්සවයේ සංවිධානය කටයුතු සඳහා මෙල්බන් වාසි දානපතියන්ගෙන් සහ ව්‍යාපාරික ප්‍රජාවගෙන් ලැබෙන මූල්‍යමය අනුග්‍රහය පිළිබඳව ආදී ශිෂ්‍ය සංගමයේ සියලුම සාමාජිකයන් වෙනුවෙන් එහි නිලධාරී මඩුල්ල තම ආදර ස්තූතිය පරිනමන්නේ කෘතවේදීවයි.

**බක් මහා සැණකෙළිය සුපුරුදු ලෙස 2013 අප්‍රේල් මස 14 වන ඉරු දින පුරා උදෑසන 8.30 සිට ඩැංඩිනොන් සංදර්ශන පිටියේදී (Dandenongshow grond Bennet Street, Dandenong)**

මෙවරද, බක් මහා සැණකෙළිය සුපුරුදු ලෙස 2013 අප්‍රේල් මස 14 වන ඉරු දින පුරා උදෑසන 8.30 සිට ඩැංඩිනොන් සංදර්ශන පිටියේදී (Dandenongshow grond Bennet Street, Dandenong,.Mel way 90 A7) පැවැත් වීමට කටයුතු සූදානම් කර තිබේ. මෙල්බන් වාසි ඔබ සැමගේ සහභාගීත්වය ගෞරවයෙන් අප සංගමය අපේක්ෂා කරමු.

ලබන්නා වූ සිංහල දමිල (හින්දු) අලුත් අවුරුද්ද සාමය සතුට පිරී සෞභාග්‍යමත් වසරක් වේවා!

**ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය**

